66666

AL/2018/21/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

**21 S I**

2018.08.06 / 1300 - 1500

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 04 | |
| 02 | 05 - 11 | |
| 03 | 12 - 17 | |
| 04 | 18 - 23 | |
| 05 | 24 - 31 | |
| 06 | 32 - 40 | |
| 07 | 41 - 45 | |
| 08 | 46 - 50 | |
| එකතුව | | |

විභාග අංකය : ..................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
* අංක **1** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

**1.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අභිමතානුරූපී ප්‍රකාශයක් වනුයේ කවරක් ද?
(1) ඉන්ධන මිල ඉහළ යාම විදුලි මෝටර් රථ සඳහා ඉල්ලුම ධෛර්යමත් කරන්නේ ය.
(2) ආදායම වැඩි වන්නේ නම් සුඛෝපභෝගී භාණ්ඩ අලෙවිය පහළ වැටෙන්නේ ය.
(3) ලැප්ටොප් මිල පහළ වැටෙන විට මිනිස්සු ඒවා වැඩියෙන් මිල දී ගනිති.
(4) නිවාස හිමියන් අය කරන ගෙවල් කුලී රජය විසින් පාලනය කළ යුතු ය.
(5) භාණ්ඩයක ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය, එහි මිල වෙනස්වීම සමග ප්‍රතිවිරුද්ධ ලෙස සම්බන්ධව පවතී.
(......)

**2.** නිෂ්පාදන සාධකයක් ලෙස භූමියට උදාහරණයක් වශයෙන් පහත සඳහන් කවරක් දැක්විය හැකි ද?
(1) මාගම්පුර වරාය
(2) දක්ෂිණ අධිවේගී මාර්ගය
(3) වික්ටෝරියා වේල්ල
(4) අඹේවෙල කිරි ගොවිපොළ
(5) පාසිකුඩා වෙරළ තීරය
(......)

**3.** නිෂ්පාදන හැකියා වක්‍රය මත කටයුතු කරන ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් සැමවිටම නිවැරදි වන්නේ ද?
(1) එය නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් විය යුතු ය.
(2) එය විධාන ආර්ථිකයක් විය යුතු ය.
(3) එහි සම්පත් පූර්ණ සේවා නියුක්තියෙහි පවතී.
(4) එය නිෂ්පාදන කාර්යක්ෂමතාව අත් කරගෙන ඇති නමුදු සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව එයට කිසිසේත් අත්කර ගත නොහැක.
(5) එයට රේඛීය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් තිබිය යුතු ය.
(......)

**4.** නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පෙන්නුම් කෙරෙන රූපසටහනක, ආවස්ථික පිරිවැය නිරූපණය කෙරෙනුයේ,
(1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ බෑවුමෙනි.
(2) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ඇතුළත ලක්ෂ්‍යයකිනි.
(3) මූලය හරහා අඳිනු ලබන සරල රේඛාවකිනි.
(4) සිරස් අක්ෂය මත ලක්ෂ්‍යයකිනි.
(5) තිරස් අක්ෂය මත ලක්ෂ්‍යයකිනි.
(......)

[දෙවැනි පිටුව බලන්න.

5. පහත සඳහන් දෑ අතුරෙන්, මනාව ක්‍රියාත්මක වන ධනේශ්වර ආර්ථිකයක් සඳහා අවශ්‍ය වන්නාවූත්, විධාන ආර්ථිකයක් සඳහා අවශ්‍ය **නොවන්නාවූත්** කරුණ කවරක් ද?
(1) මධ්‍යගත තීරණ ගැනීම (2) සම්පත් හිඟකම
(3) ඒකාධිකාරී ආයතන (4) දේපළ හිමිකම් සුරැකීම
(5) ධන බාහිරතා (……)

6. කිසියම් ආයතනයක් සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව සහිත නිමැවුම් මට්ටමෙහි සිටින විට,
(1) මුළු අයභාරය මුළු පිරිවැයට සමාන වේ.
(2) ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වේ.
(3) ආන්තික අයභාරය ආන්තික පිරිවැය ඉක්මවා යයි.
(4) මිල සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වේ.
(5) මිල ආන්තික පිරිවැයට සමාන වේ. (……)

7. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී X භාණ්ඩයෙහි මිල පහළ බසී නම්, X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළෙහි සිදුවීමට බොහෝසෙයින් ඉඩකඩ ඇත්තේ පහත සඳහන් කවරක් ද?
(1) X භාණ්ඩයෙහි සැපයුම අඩු වන්නේ ය.
(2) X භාණ්ඩය සඳහා ඉල්ලුම වැඩි වන්නේ ය.
(3) X භාණ්ඩය සඳහා ඉල්ලුම අඩු වන්නේ ය.
(4) X භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වන්නේ ය.
(5) X භාණ්ඩය සැපයුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වන්නේ ය. (……)

8. ඉල්ලුම් වක්‍රයක් ඇඳීමේදී පදනම් කරගනු ලබන උපකල්පනය වන්නේ,
(1) මිල අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය සැමවිටම වැඩි වන්නේය යන්න ය.
(2) මිල අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය සැමවිටම අඩු වන්නේය යන්න ය.
(3) මිලෙහි හටගන්නා වෙනස්කම්, සැපයුම කෙරෙහි බලපාන්නේ නැතැයි යන්න ය.
(4) ඉල්ලුමෙහි මිල නම්‍යතාව, ඉල්ලුම් වක්‍රය දිගේ වෙනස් නොවේය යන්න ය.
(5) මිල හැර ඉල්ලුම කෙරෙහි බලපාන සාධක ස්ථාවරව පවතීය යන්න ය. (……)

9. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළක සපයනු ලබන ප්‍රමාණය ($Q_S$) හා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ($Q_D$) පිළිවෙළින් $Q_S = -30 + P$ සහ $Q_D = 240 - 2P$ වශයෙන් දැක්වෙන අතර, P වලින් දැක්වෙන්නේ ඒකකයක මිල රුපියල්වලිනි. එම භාණ්ඩය මත පනවනු ලබන නිෂ්පාදන බද්දක වෙනස්වීමක් නිසා, සැපයුම $Q_S = -36 + P$ ස්වරූපය ගනී. බද්දේ හටගත් මෙම වෙනස සමතුලිත මිල කෙරෙහි බලපානුයේ කෙසේ ද?
(1) රුපියල් 2 කින් පහළ බසී. (2) රුපියල් 6 කින් පහළ බසී.
(3) රුපියල් 2 කින් ඉහළ නගී. (4) රුපියල් 6 කින් ඉහළ නගී.
(5) රුපියල් 90 කින් ඉහළ නගී. (……)

10. තේ සඳහා ඉල්ලුමත් සැපයුමත් දෙකම එකවර වැඩි වන්නේ නම්, තේ වෙළෙඳපොළෙහි සමතුලිත මිල හා ප්‍රමාණය කෙරෙහි එය කෙසේ බලපානු ලැබේ ද?

| | **මිල** | **ප්‍රමාණය** |
|---|---|---|
| (1) | වැඩි වේ. | වැඩි වේ. |
| (2) | අඩු වේ. | අඩු වේ. |
| (3) | අඩු වේ. | වැඩි වේ. |
| (4) | වැඩි වේ. | අවිනිශ්චිත ය. |
| (5) | අවිනිශ්චිත ය. | වැඩි වේ. |

(……)

11. කිසියම් පුද්ගලයෙකුගේ ආදායම ඉහළ යන විට, කිරි සඳහා ඔහුගේ ඉල්ලුම වැඩි වේ නම්, කිරි උදාහරණයක් ලෙස ගත හැක්කේ,
(1) බාල භාණ්ඩයකට ය. (2) නොමිල භාණ්ඩයකට ය.
(3) සාමාන්‍ය භාණ්ඩයකට ය. (4) ශුභ සාධන භාණ්ඩයකට ය.
(5) ගිෆන් භාණ්ඩයකට ය. (……)



EXAMMOOD.LK

**12.** කිසියම් ආයතනයක් නිපදවනු ලබන භාණ්ඩයක් සඳහා පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතී යැයි උපකල්පනය කරන්න. ආයතනය එම භාණ්ඩයේ මිල 6% කින් ඉහළ නංවනු ලැබුවහොත්, ආයතනයේ අයභාරය මත කෙබඳු බලපෑමක් ඇති වේ ද?
(1) අයභාරය නොවෙනස්ව පවතිනු ඇත.
(2) අයභාරය 6% කින් ඉහළ නගිනු ඇත.
(3) අයභාරය 6% කින් පහළ බසිනු ඇත.
(4) අයභාරය ශූන්‍ය කරා පහළ බසිනු ඇත.
(5) අයභාරය 6% කට වඩා අඩු ප්‍රමාණයකින් ඉහළ නගිනු ඇත. (......)

**13.** 2016 වර්ෂයේදී තරගකාරී වෙළෙඳපොළක, කුරුඳු කිලෝග්‍රෑම් එකක් රුපියල් 900 බැගින් කිලෝග්‍රෑම් මිලියන 10ක් අලෙවි කරන ලදී. 2017 වර්ෂයේදී, එම වෙළෙඳපොළෙහි, කිලෝග්‍රෑම් එකක් රුපියල් 800ක් බැගින් කුරුඳු කිලෝග්‍රෑම් මිලියන 10ක් අලෙවි කරන ලදී. කුරුඳු ඉල්ලුමේ සහ සැපයුමේ පහත සඳහන් කෙබඳු වෙනස්කම්, මෙම ප්‍රතිඵලය ඇති කිරීමට හේතු වූයේ ද?

| | ඉල්ලුම | සැපයුම |
|---|---|---|
| (1) | වැඩි වීම | වැඩි වීම |
| (2) | අඩු වීම | අඩු වීම |
| (3) | අඩු වීම | වැඩි වීම |
| (4) | වැඩි වීම | අඩු වීම |
| (5) | අඩු වීම | නොවෙනස්ව තිබීම |

(......)

**14.** එක්තරා පාරිභෝගික භාණ්ඩයක් සඳහා වන වෙළෙඳපොළ සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන බවත්, වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වන බවත් සලකන්න. මෙම භාණ්ඩය සඳහා ඒකක සහනාධාරයක් ලබා දීම, පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය කෙරෙහි කෙසේ බලපානු ලබන්නේ ද?

| | පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදක අතිරික්තය |
|---|---|---|
| (1) | අඩු වේ. | අඩු වේ. |
| (2) | අඩු වේ. | වැඩි වේ. |
| (3) | වැඩි වේ. | වැඩි වේ. |
| (4) | වැඩි වේ. | අඩු වේ. |
| (5) | වැඩි වේ. | නොවෙනස්ව පවතී. |

(......)

**15.** තරගකාරී වෙළෙඳපොළක අලෙවි කෙරෙන භාණ්ඩයකට අදාළ වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර, පහත සඳහන් සමීකරණයන්ගෙන් නිරූපණය වේ යැයි සලකන්න.

$$Q_D = 160 - 4P \qquad Q_S = -20 + 2P$$

වෙළෙඳපොළ සමතුලිත වන විට මිල ඉල්ලුම් නම්‍යතාවය
(1) –2.4 කි. (2) –2.6 කි. (3) –2.8 කි. (4) –3.0 කි. (5) –5.3 කි. (......)

**16.** ආයතනයක් තම කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේදී, එක් විචල්‍ය යෙදවුමක් පමණක් භාවිත කරනු ලැබේ යැයි උපකල්පනය කරන්න. මෙහිදී ආයතනය හීනවන ඵලයන්ට මුහුණ දෙනු ලැබේ නම්, එකී විචල්‍ය යෙදවුම වැඩි වැඩියෙන් භාවිත කරත්ම පහත සඳහන් කවරක් සිදු විය හැකි ද?
(1) ආන්තික පිරිවැය ස්ථාවර වේගයකින් පහළ වැටෙන්නේ ය.
(2) ආන්තික පිරිවැය අඩු වන වේගයකින් පහළ වැටෙන්නේ ය.
(3) ආන්තික පිරිවැය ඉහළ නගින්නේ ය.
(4) ආන්තික නිෂ්පාදිතය ස්ථාවර වේගයකින් ඉහළ නගින්නේ ය.
(5) ආන්තික නිෂ්පාදිතය අඩු වන වේගයකින් ඉහළ නගින්නේ ය. (......)

**17.** එක්තරා ආයතනයක නිමැවුම ශූන්‍ය වන විට, මුළු පිරිවැය රුපියල් 300ක් වේ. ඒකක 5ක් නිෂ්පාදනය කරන විට මුළු පිරිවැය රුපියල් 630ක් වේ. ඒකක 5ක් නිෂ්පාදනය කරන විට සාමාන්‍ය විචල්‍ය පිරිවැය කොපමණ ද?
(1) රුපියල් 60 (2) රුපියල් 66
(3) රුපියල් 122 (4) රුපියල් 126
(5) රුපියල් 330 (......)

EXAMMOOD.LK EXAMMOOD.LK

18. පහත සඳහන් කවර ද පූර්ණ තරගකාරී වෙළෙඳපොළක ලක්ෂණ වන්නේ ද?
A - අලුත් ආයතනවලට ඉතා පහසුවෙන් වෙළෙඳපොළට ප්‍රවේශ විය හැකි ය.
B - භාණ්ඩ ප්‍රභේදනයක් නොමැත.
C - වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ.
D - වෙළෙඳපොළ තුළ සිටින එක් එක් ආයතනයේ සැපයුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ.
(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) A, B සහ C පමණි.
(4) A, B සහ D පමණි.
(5) B, C පමණි.
(……)

19. පූර්ණ තරගකාරී ආයතනයක පවත්නා නිමැවුම් මට්ටමේදී ආන්තික පිරිවැය රුපියල් 80කි. සාමාන්‍ය විචල්‍ය පිරිවැය රුපියල් 50කි. සාමාන්‍ය ස්ථාවර පිරිවැය රුපියල් 30ක් සහ භාණ්ඩයේ මිල රුපියල් 80ක් වේ. මෙම ආයතනය සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?
(1) ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වන බැවින් ආර්ථික ලාභ ශූන්‍ය වේ.
(2) මුළු අයභාරය මුළු පිරිවැයට වඩා අඩු බැවින් ආර්ථික ලාභ ඍණ වේ.
(3) මුළු අයභාරය මුළු පිරිවැයට වඩා වැඩි බැවින් ආර්ථික ලාභ ධන වේ.
(4) මිල, සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩි බැවින් ආර්ථික ලාභ ඍණ වේ.
(5) මිල, සාමාන්‍ය මුළු පිරිවැයට සමාන බැවින් ආර්ථික ලාභ ශූන්‍ය වේ.
(……)

20. ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාවක් පැවතිය හැක්කේ පහත සඳහන් කවර වෙළෙඳපොළ ව්‍යුහයක් තුළ ද?
(1) කතිපයාධිකාරය
(2) ඒකාධිකාරය
(3) පූර්ණ තරගය
(4) ස්වාභාවික ඒකාධිකාරය
(5) ඒකාධිකාරී තරගය
(……)

21. කුටුම්බ හා ව්‍යාපාරික ආයතනවලින් පමණක් සමන්විත ආර්ථිකයක, ආදායමේ චක්‍රීය ප්‍රවාහය සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් අනුකූල වන්නේ ද?
(1) කුටුම්බ, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන්නන් වන අතර ව්‍යාපාරික ආයතන, නිෂ්පාදන සම්පත් පරිභෝජනය කරන්නෝ වෙති.
(2) කුටුම්බ, නිෂ්පාදන සම්පත් භාවිත කරන්නන් වන අතර ව්‍යාපාරික ආයතන, ඉතුරුම් ජනනය කරන්නෝ වෙති.
(3) කුටුම්බ, නිෂ්පාදන සම්පත් සපයන්නන් වන අතර ව්‍යාපාරික ආයතන, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන්නෝ වෙති.
(4) ව්‍යාපාරික ආයතන, බදු එකතු කරන්නන් වන අතර කුටුම්බ, බදු ආදායම ජනනය කරන්නෝ වෙති.
(5) ව්‍යාපාරික ආයතන, නිෂ්පාදන සම්පත් සපයන්නන් වන අතර කුටුම්බ, භාණ්ඩ හා සේවා පරිභෝජනය කරන්නෝ වෙති.
(……)

22. දළ දේශීය නිෂ්පාදිතය නිර්වචනය කරනු ලබනුයේ පහත සඳහන් කවර ප්‍රකාශයකින් ද?
(1) දෙන ලද කාලපරිච්ඡේදයක් තුළදී, ආර්ථිකයක් විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු නිමැවුමේ ප්‍රමාණයයි.
(2) දෙන ලද කාලපරිච්ඡේදයක් තුළදී, ආර්ථිකයක් විසින් නිෂ්පාදනය කරනු ලබන සියලුම නිමැවුම්වල මුළු වෙළෙඳපොළ වටිනාකමයි.
(3) දෙන ලද කාලපරිච්ඡේදයක් තුළදී, ආර්ථිකයක් විසින් නිෂ්පාදනය කරනු ලබන සියලුම අවසාන භාණ්ඩ හා සේවාවල මුළු වෙළෙඳපොළ වටිනාකමයි.
(4) දෙන ලද කාලපරිච්ඡේදයක් තුළදී, දේශීය වෙළෙඳපොළෙහි අලෙවි කරන ලද අවසාන භාණ්ඩ හා සේවාවල මුළු වටිනාකමයි.
(5) දෙන ලද කාලපරිච්ඡේදයක් තුළදී, ආර්ථිකයක් විසින් නිෂ්පාදනය කරන ලද සියලුම අවසාන භාණ්ඩ හා සේවාවල මුළු වෙළෙඳපොළ වටිනාකමින්, අපනයන භාණ්ඩ හා සේවාවල වෙළෙඳපොළ වටිනාකම අඩු කළ විට ලැබෙන අගයයි.
(……)

23. දළ ජාතික ආදායම මිනුම් කිරීමේදී එයට ඇතුළත් **නොවනුයේ** කවරක් ද?
(1) සේවා වියුක්තිකයන් සඳහා ලබා දෙන මූල්‍යාධාර
(2) කොටස් හිමියන් වෙත ගෙවනු ලබන ලාභාංශ
(3) සමාගම් විසින් රඳවාගනු ලබන ලාභ
(4) ඉඩම් හිමියන් වෙත ගෙවනු ලබන බදු කුලී
(5) සම්පත් හිමිකරුවන් වෙත ගෙවනු ලබන දේපොළ ආදායම්
(……)



EXAMMOOD.LK

**24.** කර්මාන්ත තුනකින් පමණක් සමන්විත කල්පිත ආර්ථිකයක් පිළිබඳ උපකල්පනය කරන්න. A කර්මාන්තය, රුපියල් මිලියන 30ක ආනයන යෙදවුම් භාවිත කරමින් නිෂ්පාදනය කරනු ලබන තම නිමැවුම, රුපියල් මිලියන 100කට B කර්මාන්තය වෙත අලෙවි කරයි. B කර්මාන්තය, ආනයන කිසිවක් භාවිත නොකොට රුපියල් මිලියන 300ක් වටිනා නිමැවුම් ප්‍රමාණයක් C කර්මාන්තය වෙත අලෙවි කරන අතර, තවත් රුපියල් මිලියන 60ක් වටිනා නිමැවුම් විදේශීය රටකට අපනයනය කරයි. C කර්මාන්තය, රුපියල් මිලියන 30ක ආනයන යෙදවුම් භාවිත කරමින් නිෂ්පාදනය කළ තම නිමැවුම, රුපියල් මිලියන 500කට අවසාන පරිභෝජකයන්ට අලෙවි කරයි.

මෙම ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය කොපමණ ද?

(1) රුපියල් මිලියන 440 (2) රුපියල් මිලියන 500
(3) රුපියල් මිලියන 900 (4) රුපියල් මිලියන 960
(5) රුපියල් මිලියන 990 (......)

**25.** ආදායම් මට්ටම රුපියල් 5 000 සිට රුපියල් 10 000 දක්වා වැඩි වන විට, පරිභෝජන වියදම රුපියල් 7 000ක සිට රුපියල් 11 000ක් දක්වා ඉහළ නගී. මෙහිදී ආන්තික පරිභෝජන නැඹියාව

(1) 0.8කි. (2) 0.9කි. (3) 1.0කි. (4) 1.2කි. (5) 1.4කි. (......)

**26.** දළ දේශීය නිෂ්පාදිතයේ විශාලතම අඩුවීමකට බලපානුයේ පහත සඳහන් කවරක් ද?

(1) ආණ්ඩුවේ මිල දී ගැනීම් හා බදු අය කිරීම් යන දෙකම රුපියල් බිලියන 50කින් ඉහළ යාම
(2) ආණ්ඩුවේ මිල දී ගැනීම් හා බදු අය කිරීම් යන දෙකම රුපියල් බිලියන 50කින් අඩු වීම
(3) රුපියල් බිලියන 50කින් බදු වැඩි කිරීම
(4) රුපියල් බිලියන 50කින් ආණ්ඩුවේ මිල දී ගැනීම් අඩු වීම
(5) රුපියල් බිලියන 50කින් ශුද්ධ අපනයන ඉහළ යාම (......)


**27.** රාජ්‍ය අංශයක් නොමැති ආර්ථිකයක, පරිභෝජනය (C), ආයෝජනය (I), අපනයන (X) සහ ආනයන (M) අගයන් පහත දැක් වේ.

$C = 200 + 0.75Y \quad I = 500 \quad X = 150 \quad M = 100$

මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම (Y) කොපමණ ද?

(1) 3 000 (2) 3 400 (3) 3 600 (4) 3 750 (5) 3 800 (......)

**28.** පහත දැක්වෙන රූපසටහනෙහි සමතුලිත ජාතික ආදායම් මට්ටම $0Y_1$ ලෙසත්, පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම් මට්ටම $0Y^*$ ලෙසත් පෙන්නුම් කරයි.




මෙම ආර්ථිකයේ අවධමනාත්මක පරතරය කොපමණ ද?

(1) Y*U
(2) UV
(3) KV
(4) MV
(5) $Y_1Y^*$ (......)

**29.** ශ්‍රී ලංකාවේ ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි පාද වර්ෂය කුමක් ද?

(1) 1951 (2) 2006/07 (3) 2010 (4) 2012/13 (5) 2014 (......)

**30.** පහත සඳහන් කවරක් පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනයට හේතු වේ ද?

(1) ශ්‍රමයේ මිල ඉහළ යාමක් (2) විදුලිබලයේ මිල පහළ බැසීමක්
(3) කුටුම්බ පරිභෝජනයේ ඉහළ යාමක් (4) රජයේ මිල දී ගැනීම් පහළ බැසීමක්
(5) මුදල් සැපයුමෙහි වැඩි වීමක් (......)

**31.** කිසියම් රටක මුදල් සැපයුමෙහි වැඩි වීමක් ඇති වීමට බොහෝ දුරට හේතු වනුයේ පහත සඳහන් කවරක් ද?

(1) ගෙවුම් ශේෂ අතිරික්තයක්
(2) ආණ්ඩුවේ අයවැය ලේඛනයේ අතිරික්තයක්
(3) වාණිජ බැංකු තැන්පත්කරුවන් විසින් මුදල් ඉවත් කර ගැනීමක්
(4) වාණිජ බැංකු විසින් දෙන ලද ණය ආපසු කැඳවීමක්
(5) මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත සුරැකුම්පත් අලෙවි කිරීමක් (......)



EXAMMOOD.LK

**32.** මුදල් සඳහා වන ගනුදෙනු ඉල්ලුම, ඉතා කිට්ටුවෙන් බැඳී පවත්නා මුදලේ කාර්යය වනුයේ,
(1) වටිනාකම් සන්නිධියක් වීම ය.
(2) සම්මත ගිණුම් ඒකකයක් වීම ය.
(3) වටිනාකම පිළිබඳ මිනුමක් වීම ය.
(4) හුවමාරු මාධ්‍යයක් වීම ය.
(5) විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම ය. (......)

**33.** වාණිජ බැංකු ශේෂ පත්‍රයක වගකීමක් වනුයේ පහත සඳහන් කවරක් ද?
(1) භාණ්ඩාගාර බිල්පත්
(2) ගනුදෙනුකරුවන්ගේ තැන්පතු
(3) ණය හා අත්තිකාරම්
(4) ඒක්ෂණ ණය
(5) වට්ටම් කළ බිල්පත් (......)

**34.** ශ්‍රී ලංකා මහ බැංකුව වර්තමානයේ සිය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී, භාවිත කරනු ලබන ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණ කවරේ ද?
(1) බැංකු අනුපාතිකය හා ප්‍රතිපත්ති පොලී අනුපාතික
(2) ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා හා විවට වෙළෙඳපොළ කටයුතු
(3) යහපෙළඹුම (ශිෂ්ට ප්‍රයෝග) හා ප්‍රතිපත්ති පොලී අනුපාතික
(4) ණය සීමා කිරීම හා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා
(5) ප්‍රතිපත්ති පොලී අනුපාතික හා විවට වෙළෙඳපොළ කටයුතු (......)

**35.** කිසියම් භාණ්ඩයක් පරිභෝජනය කිරීමේදී ධන බාහිරතා ජනනය කෙරෙන විට, එබඳු භාණ්ඩයක වෙළෙඳපොළ සමතුලිතය පිළිබඳව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?
(1) ආන්තික සමාජ ප්‍රතිලාභය, ආන්තික පෞද්ගලික පිරිවැයට වඩා අඩු ය.
(2) ආන්තික සමාජ ප්‍රතිලාභය, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභයට වඩා විශාල ය.
(3) ආන්තික සමාජ පිරිවැය, ආන්තික සමාජ ප්‍රතිලාභයට වඩා වැඩි ය.
(4) ආන්තික සමාජ පිරිවැය, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභයට වඩා අඩු ය.
(5) ආන්තික සමාජ පිරිවැය, ආන්තික සමාජ ප්‍රතිලාභයට සමාන වේ. (......)

**36.** 'ආණ්ඩුව අසමත් වීම' නමින් ආර්ථික විද්‍යාඥයින් විසින් හඳුන්වනු ලබන සංසිද්ධියට වඩාත් ම බලපෑ හැකි හේතුව වන්නේ පහත සඳහන් ඇ අතුරෙන් කවරක් ද?
(1) ඇතැම් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේදී සෘණ බාහිරතා හටගැනීම
(2) අවගුණ භාණ්ඩ (demerit goods) අධි පරිභෝජනය
(3) ආදායම් හා ධන ව්‍යාප්තිය අසමාන වීම
(4) වෙළෙඳපොළවල අපූර්ණ තරගය පැවතීම
(5) දේශපාලනඥයින් ස්වාර්ථය උදෙසා යොමු වීම (......)

**37.** ශුද්ධ පොදු භාණ්ඩයක්, තවත් එක් අතිරේක පාරිභෝගිකයකු වෙත සැපයීමේ ආන්තික පිරිවැය පිළිබඳව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?
(1) ධන අගයක් ගනියි.
(2) ශුන්‍යයට සමාන ය.
(3) භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආරම්භක පිරිවැයට සමාන වේ.
(4) පාරිභෝගිකයන් සංඛ්‍යාව අඩුවෙත්ම අඩු වේ.
(5) පාරිභෝගිකයන් සංඛ්‍යාව අඩුවෙත්ම වැඩි වේ. (......)

**38.** ශ්‍රී ලංකාවේ බදු අයභාරයේ ප්‍රධාන මූලාශ්‍ර වනුයේ,
(1) ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද හා නිෂ්පාදන බදු වේ.
(2) එකතු කළ අගය මත බද්ද, පිරිවැටුම් බද්ද හා ආර්ථික සේවා ගාස්තු වේ.
(3) ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද හා මුද්දර බද්ද වේ.
(4) එකතු කළ අගය මත බද්ද, ආනයන බද්ද හා ජාතිය ගොඩගැනීමේ බද්ද වේ.
(5) එකතු කළ අගය මත බද්ද, වරාය හා ගුවන්තොටුපළ ගාස්තු හා ආර්ථික සේවා ගාස්තු වේ. (......)

**39.** ආර්ථික පසු බැසීමක් (ප්‍රතිගමනය) සමනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් වනුයේ පහත සඳහන් කවරක ඉහළ නැංවීමක් ද?
(1) පොලී අනුපාතික
(2) මුදල් සැපයුම
(3) බදු
(4) ආණ්ඩුවේ බැඳුම්කර අලෙවි කිරීම
(5) ආණ්ඩුවේ වියදම් (......)

**40.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ අපනයනවල ප්‍රධාන දිශානතිය හා ආනයනවල ප්‍රධාන මූලාශ්‍රය වනුයේ පිළිවෙළින්,
(1) ඇමරිකා එක්සත් ජනපදය හා එක්සත් රාජධානියයි.
(2) ඇමරිකා එක්සත් ජනපදය හා චීනයයි.
(3) යුරෝපීය සංගමය හා ඉන්දියාවයි.
(4) එක්සත් රාජධානිය හා චීනයයි.
(5) එක්සත් රාජධානිය හා ඉන්දියාවයි. (......)

[හත්වැනි පිටුව බලන්න.

**41.** කිසියම් රටක වෙළෙඳ අනුපාතය, එහි පාද වර්ෂ අගය වන 100 සිට පසු වර්ෂයේදී 130 දක්වා වැඩි වූයේ ය. අපනයන මිලයන්හි හා ආනයන මිලයන්හි කවර වෙනසක් මේ තත්ත්වය ඇති වීමෙහි ලා හේතු වී ඇත් ද?

| | **අපනයන මිල දර්ශකය** | **ආනයන මිල දර්ශකය** |
|---|---|---|
| (1) | 30% කින් අඩු විය. | 10% කින් වැඩි විය. |
| (2) | 20% කින් අඩු විය. | 10% කින් අඩු විය. |
| (3) | 30% කින් වැඩි විය. | වෙනස් නොවී ය. |
| (4) | 10% කින් වැඩි විය. | 20% කින් අඩු විය. |
| (5) | වෙනස් නොවී ය. | 30% කින් වැඩි විය. |

(……)

**42.** කිසියම් රටක වෙළෙඳ ශේෂ අතිරික්තය ඉහළ යාමට හේතුවක් වනුයේ,


(1) දේශීය උද්ධමනය ඉහළ යාමයි.
(2) ආනයන පහළ යාම හා අපනයන ඉහළ යාමයි.
(3) වෙළෙඳ හවුල්කාර රටවල් විසින් ඉහළ තීරු බදු පැනවීමයි.
(4) රට තුළට ගලා එන සෘජු විදේශ ආයෝජන ප්‍රවාහ ඉහළ යාමයි.
(5) ව්‍යවහාර මුදල් ඒකකයේ අගය ඉහළ යාමයි. (……)

**43.** 2016/17 වර්ෂයේදී මානව සංවර්ධන දර්ශකය සහ ගෝලීය තරගකාරීත්ව දර්ශකය තුළ, ශ්‍රී ලංකාව හිමිකර ගත් ස්ථාන නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් කවර සංයෝජනයක් මගින් ද?

| | **මානව සංවර්ධන දර්ශකය** | **ගෝලීය තරගකාරිත්ව දර්ශකය** |
|---|---|---|
| (1) | 73 | 71 |
| (2) | 73 | 60 |
| (3) | 72 | 58 |
| (4) | 70 | 68 |
| (5) | 68 | 85 |

(……)

**44.** පහත දැක්වෙන රූපසටහන පෙන්නුම් කරනුයේ, ජපන් යෙන් සඳහා ඇති විදේශ විනිමය වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා රුපියල් සඳහා ඇති ඉල්ලුම හා ශ්‍රී ලංකා රුපියල් සැපයුමයි. K ලක්ෂ්‍යයේදී ආරම්භක වශයෙන් වෙළෙඳපොළ සමතුලිත වී ඇත. ශ්‍රී ලංකාව, මෝටර් රථ ආනයනය මත අය කරන තීරු බදු සැලකිය යුතු පරිදි පහළ හෙළීම නිසා, ආනයනය කරනු ලබන මෝටර් රථ සඳහා ඉල්ලුම වැඩිවීමෙන් විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඇති විය හැකි අළුත් සමතුලිත ලක්ෂ්‍යය කවරක් ද?




(1) A (2) B (3) C (4) D (5) E (……)

**45.** ආදායම් විෂමතාව මිනිය හැක්කේ,

(1) දළ දේශීය නිෂ්පාදිතය සහ දළ ජාතික ආදායම අතර වෙනස මගිනි.
(2) ජිනි සංගුණකය මගිනි.
(3) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය මගිනි.
(4) ජාතික දරිද්‍රතා ඉම මගිනි.
(5) ප්‍රතිශීර්ෂ ආදායම මගිනි. (……)



EXAMMOOD.LK

**46.** පහත සඳහන් දර්ශක අතුරෙන් වර්තමානයේ මානව සංවර්ධන දර්ශකය සැකසීම සඳහා යොදා ගැනෙන දර්ශක තුන තෝරන්න.

A - ක්‍රය ශක්ති සාම්‍යයට ගළපන ලද ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම් දර්ශකය
B - උපත් අනුපාතික දර්ශකය
C - ආයු අපේක්ෂා දර්ශකය
D - වැඩිහිටි සාක්ෂරතා දර්ශකය
E - අධ්‍යාපන දර්ශකය

(1) A, B සහ C (2) A, C සහ D (3) A, C සහ E
(4) A, D සහ E (5) C, D සහ E (……)

**47.** රටවල් අතර ජීවන තත්ත්වයේ වෙනස්කම් පෙන්නුම් කිරීමෙහි ලා ප්‍රතිශීර්ෂ මූර්ත දළ ජාතික ආදායම් මිනුම, නොමග යවනසුළු දර්ශකයක් වේය යන්න ඇඟැවෙන්නේ පහත සඳහන් කවර තර්ක දෙකක් මගින් ද?

A - උද්ධමන අනුපාතිකයන්ගේ වෙනස්කම් සැලකිල්ලට නොගනී.
B - වෙළෙඳපොළ නොවන ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳව, රටවල් අතර විවිධ මට්ටමින් වෙනස්කම් පවතී.
C - පාරිභෝගික අභිරුචීන්හි පවත්නා වෙනස්කම් සැලකිල්ලට නොගනී.
D - විනිමය අනුපාතිකය විකෘතිවීම් සැලකිල්ලට නොගනී. එබැවින් එම මිනුම ප්‍රකාශ කළ යුත්තේ 'ක්‍රය ශක්ති සාම්‍යයන්' පදනම් කර ගනිමිනි.
E - 'ආදායම් ප්‍රවේශය' ඔස්සේ ගණනය කරන දළ ජාතික ආදායම් මිනුම 'වියදම් ප්‍රවේශය' ඔස්සේ ගණනය කෙරෙන අගයට වඩා වෙනස් විය හැකි ය.

(1) A සහ B (2) B සහ C (3) B සහ D
(4) C සහ D (5) D සහ E (……)

**48.** තිරසාර සංවර්ධන අභිමතාර්ථ අතුරෙන් පළමුවන අභිමතාර්ථය දරිද්‍රතාවය පිළිබඳව ය. එම අභිමතාර්ථයෙන් අරමුණු කරනුයේ,

(1) 2030 වන විට දරිද්‍රතාවය අඩකින් කපා හැරීම ය.
(2) 2030 වන විට සෑම තැනම සෑම ස්වරූපයකම දරිද්‍රතාවය අවසන් කිරීම ය.
(3) 2030 වන විට දරිද්‍රතාවය 75% කින් අඩු කිරීම ය.
(4) කුසගින්න නිමා කොට සෑම පුද්ගලයකුටම ප්‍රමාණවත් ලෙස ආහාර ලබා ගැනීමට ඇති හැකියාව සහතික කරලීම ය.
(5) දරිද්‍රතාවය අඩුකර ගැනීමෙහි ලා ප්‍රගතියක් අත්කර ගැනීමට සෑම රටකටම ආධාර කිරීම ය. (……)

**49.** කිසියම් රටක ජනගහනය ප්‍රධාන වයස් කාණ්ඩ තුනක් අතර ව්‍යාප්ත වී ඇති ආකාරය පහත වගුවෙහි දැක්වේ.

| වයස් කාණ්ඩය | ජනගහනය (මිලියන) |
|---|---|
| අවුරුදු 0 - 14 | 6 |
| අවුරුදු 15 - 64 | 20 |
| අවුරුදු 65 සහ ඊට වැඩි | 4 |

මෙම රටෙහි මුළු යැපුම් අනුපාතිකය,

(1) 10% කි. (2) 20% කි. (3) 30% කි. (4) 33% කි. (5) 50% කි. (……)

**50.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙහි ආංශික සංයුතිය නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් වගුවේ කවර දත්ත පෙළකින් ද?

| | කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය (%) | කර්මාන්ත (%) | සේවා (%) |
|---|---|---|---|
| (1) | 5 | 20 | 64 |
| (2) | 7 | 27 | 57 |
| (3) | 10 | 25 | 50 |
| (4) | 12 | 28 | 48 |
| (5) | 15 | 30 | 45 |

(……)

* * *

66656 30531

AL/2018/21/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

| | |
|---|---|
| ආර්ථික විද්‍යාව | II |
| பொருளியல் | II |
| Economics | II |

**21 S II**

**2018.08.07 / 1300 - 1610**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

* '**අ**' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, '**ආ**' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

* ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**1.** (i) නිෂ්පාදන සාධකයක් වශයෙන් ව්‍යවසායකත්වය, ශ්‍රමයෙන් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

(ii) "වැඩෙන ආවස්ථික පිරිවැය නීතිය" පැහැදිලි කරන්න. ආවස්ථික පිරිවැය ඉහළ යාමට හේතු වන කරුණු කවරේ ද? (ලකුණු 04යි)

(iii) ඕනෑම ආර්ථික පද්ධතියක් විසින් විසඳා ගත යුතු මූලික ආර්ථික ප්‍රශ්න **තුන** නම් කොට, එම ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සැකසී ඇති ප්‍රධාන ආර්ථික පද්ධති **තුන** සැකෙවින් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iv) සේවා වියුක්ති අනුපාතිකයේ ඉහළ යාමක් සහ වැඩ කරන වයසේ ජනගහනයේ ඉහළ යාමක් නිසා ආර්ථිකය මත ඇති කරන බලපෑම, නිෂ්පාදන හැකියා වක්‍ර භාවිත කරමින් වෙන් වෙන්ව පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) "කිසියම් භාණ්ඩයක් පරිභෝජනය කරන විට, ඒ සඳහා ඔබගෙන් මිලක් අයකරනු නොලැබුවේ නම්, එම භාණ්ඩය ආර්ථික නොවන භාණ්ඩයක් විය යුතු ය."
මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

**2.** (i) පෞද්ගලික ඉල්ලුම් වක්‍රය සහ වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය අතර වෙනස දක්වන්න. (ලකුණු 02යි)

(ii) "ගිෆන් භාණ්ඩයක් බාල භාණ්ඩයක් වන අතර, බාල භාණ්ඩයක් අවශ්‍යයෙන්ම ගිෆන් භාණ්ඩයක් නොවේ." පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) මිල ඉල්ලුම් නම්‍යතාව යන්නෙන් කවරක් අදහස් වේ ද? (ලකුණු 02යි)

(iv) කිසියම් රටක වට්ටක්කා වගාවේ නිරත ගොවීන්ට, වට්ටක්කා අලෙවියෙන් දිවි රැකගැනීම අතිශයින් දුෂ්කර කාර්යයක් බවට පත්ව ඇතැයි සලකන්න. වට්ටක්කා වෙළෙඳපොළේ පවත්නා ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් පහත සමීකරණයන්ගෙන් දැක්වේ.

ඉල්ලුම $(Q_D) = 350 - 10P$ සැපයුම $(Q_S) = -40 + 5P$

මෙහි P යන්නෙන් කිලෝග්‍රෑමයක මිල රුපියල්වලින් ද, Q යන්නෙන් ඒකක ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් ද අදහස් කෙරේ.

(අ) වෙළෙඳපොළේ සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) ගොවීන්ට සහනයක් සැපයීමේ අරමුණින්, රජය ඌනපූරණ ගෙවීම් ක්‍රමයක් (deficiency payment scheme) හඳුන්වා දෙනු ලැබේ යැයි සලකන්න. ඒ යටතේ වට්ටක්කා කිලෝග්‍රෑමයකට රුපියල් 30ක්, ගොවීන් වෙත ලබා දීමට රජය සහතික කරන අතර, තම මුළු අස්වැන්නම වෙළෙඳපොළේ පවත්නා කවර මිලකට වුව ද අලෙවි කරගන්නා ලෙස ගොවීන් හට දැනුම් දෙනු ලැබේ.

දැන් කොපමණ වට්ටක්කා ප්‍රමාණයක් ගොවීන් විසින් වෙළෙඳපොළට සපයනු ලැබේ ද? (ලකුණු 02යි)

[දෙවැනි පිටුව බලන්න

EXAMMOOD.LK

(ඉ) තමන්ගේ මුළු සැපයුම අලෙවිකර ගැනීමට ගොවීන් විසින් කවර මිලක් අය කළ යුතු වේ ද? (ලකුණු 02යි)

(ඊ) ඌනපූරණ ගෙවීම් වශයෙන් කොතරම් මුදලක් රජයෙන් ගොවීන් වෙත ලැබේ ද? (ලකුණු 02යි)

(උ) ඌනපූරණ ගෙවීම් ක්‍රමය හඳුන්වා දුන් පසු, පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 04යි)

**3.** (i) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය දැයි දක්වා, ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(අ) හීනවන ඵල හටගන්නා විට, මුළු නිෂ්පාදිතය පහළ වැටීමට පටන් ගනී.

(ආ) දේපොළ බදු, ගොඩනැගිලි සඳහා රක්ෂණ ගාස්තු ගෙවීම් සහ ක්‍රමක්ෂය ගාස්තු (amortization payments) ස්ථාවර පිරිවැය වේ.

(ඉ) හීනවන ඵල සහ අඩුවන පරිමාණානුකූල ඵල යනු එකම දෙයක් වෙනස් ආකාරවලින් ප්‍රකාශ කිරීමකි.

(ඊ) ආන්තික පිරිවැය, සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩි නම්, ආන්තික පිරිවැය පහළ බැසිමින් තිබිය යුතු ය. (ලකුණු 08යි)

(ii) කර්මාන්තයක් තුළට 'ප්‍රවේශවීමේ බාධක' යනුවෙන් අදහස් වන්නේ කවරක් දැයි උදාහරණ **දෙකක්** භාවිත කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) පූර්ණ තරගකාරී ආයතනයක සැපයුම් වක්‍රය සහ එහි ආන්තික පිරිවැය වක්‍රය අතර පවතින සම්බන්ධතාවය කුමක් ද? (ලකුණු 04යි)

(iv) ආර්ථික බදු කුලිය සහ සංක්‍රාම ඉපැයීම අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

**4.** (i) කිසියම් රටක, මෙම වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය මිනුම් කිරීමේදී, පහත සඳහන් දෑ අතුරෙන් කවරක් ඇතුළත් කර ගනු ලැබේ ද, කවරක් බැහැර කරනු ලැබේ ද යන්න දක්වා, එක් එක් කරුණ සම්බන්ධයෙන් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(අ) ගෘහණියක් මෙම වර්ෂයේදී තම ගෙවත්තෙහි එළවළු වගාකොට, මුළු අස්වැන්නම තම නිවසේ පරිභෝජනයට ගනී.

(ආ) විශ්‍රාමික සේවකයෙක් තම විශ්‍රාම වැටුප රජයෙන් ලබා ගනී.

(ඉ) මෝටර් රථ වෙළෙන්දෙක් පාවිච්චි කරන ලද මෝටර් රථයක් අලෙවි කොට, ඒ සඳහා කොමිස් මුදලක් උපයා ගනී.

(ඊ) මවක් තම දියණියට නිවසේදී ගණිත පාඩමක් ඉගෙනීමට උදව් කරයි. (ලකුණු 04යි)

(ii) කල්පිත ආර්ථිකයක් පිළිබඳ පහත සඳහන් දත්ත ඔබ වෙත ලබා දී ඇතැයි උපකල්පනය කරන්න.

| **අයිතමය** | **වටිනාකම (රුපියල් මිලියන)** |
|---|---|
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 800 |
| පෞද්ගලික පරිභෝජන වියදම් | 3 000 |
| ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම් | 100 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම් | 900 |
| තොග වෙනස්වීම් | –50 |
| අපනයන | 450 |
| ආනයන | 600 |
| නිෂ්පාදනය මත ශුද්ධ බදු | 150 |

වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න. (ලකුණු 04යි)

(iii) කිසියම් ආර්ථිකයක මිනිසුන්ගේ ජීවන තත්ත්වය මැනීමේ මිනුමක් ලෙස, දළ දේශීය නිෂ්පාදිතය යොදා ගැනීමේ සීමාවන් කවරේ ද? (ලකුණු 04 යි)

(iv) පහත දැක්වෙන දෑ පැහැදිලි කරන්න.

(අ) එකතු කළ අගය

(ආ) පරිලේඛන (තොග) ආයෝජනය

(ඉ) දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

(ඊ) නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් (ලකුණු 08යි)

[තුන්වැනි පිටුව බලන්න

EXAMMOOD.LK EXAMMOOD.LK

**5.** (i) පෙළැඹුණු පරිභෝජනය සහ ස්වායත්ත පරිභෝජනය අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(ii) කිසියම් ආර්ථිකයක් පිළිබඳ පහත දැක්වෙන සාර්ව ආර්ථික දත්ත සැලකිල්ලට ගන්න.

$C = 60 + 0.8\,Y_D$ $I = 100$ $G = 200$ $T = 150$ $Tr = 75$

$Y_D$ = වැය කළ හැකි ජාතික ආදායම  C = පරිභෝජනය

I = ආයෝජනය  G = ආණ්ඩුවේ මිල දී ගැනීම්

T = බදු අය කිරීම්  Tr = සංක්‍රාම

(අ) මෙම ආර්ථිකයේ ඉතුරුම් ශ්‍රිතය කුමක් ද? (ලකුණු 02යි)

(ආ) වැය කළ හැකි ජාතික ආදායම ($Y_D$) = 500ක් වේ නම්, සාමාන්‍ය පරිභෝජන නැඹියාව සහ සාමාන්‍ය ඉතුරුම් නැඹියාව ගණනය කරන්න. (ලකුණු 04යි)

(ඉ) සමතුලිත ජාතික ආදායම් මට්ටම කොපමණ ද? (ලකුණු 04යි)

(ඊ) ආයෝජන ගුණකයේ අගය කොපමණ ද? (ලකුණු 02යි)

(iii) කිසියම් කල්පිත ආර්ථිකයක, ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) රුපියල් බිලියන 400ක් ද, බදු අයකිරීම් (T) රුපියල් බිලියන 300ක් ද, පෞද්ගලික ඉතුරුම් (S) රුපියල් බිලියන 200ක් ද, පෞද්ගලික ආයෝජන (I) රුපියල් බිලියන 250ක් ද වේ යැයි උපකල්පනය කරන්න.
මෙම ආර්ථිකයේ ශුද්ධ අපනයනවල අගය කොපමණ වේ ද? (ලකුණු 04යි)

## 'ආ' උප කොටස

(මෙම කොටසෙන් ද අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**6.** (i) ශ්‍රී ලංකාවේ පොදු මිල මට්ටමෙහි වෙනස්කම් දැක්වීමෙහි ලා වර්තමානයේ යොදා ගැනෙන මිනුම් කවරේ ද? (ලකුණු 03යි)

(ii) උද්ධමනයේ අහිතකර ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 04යි)

(iii) කිසියම් රටක වාණිජ බැංකු පද්ධතිය තුළ කටයුතු කරන එක් වාණිජ බැංකුවක සරල ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

| වගකීම් | වටිනාකම (රුපියල් මිලියන) | වත්කම් | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|---|---|
| තැන්පතු | 100 000 | අවශ්‍ය කරන සංචිතය | 10 000 |
| කොටස් හිමියන්ගේ ප්‍රාග්ධනය | 25 000 | අධි සංචිත | 5 000 |
| | | සුරැකුම්පත් | 30 000 |
| | | ණය | 80 000 |
| **මුළු වගකීම්** | **125 000** | **මුළු වත්කම්** | **125 000** |

(අ) අවශ්‍ය කරන සංචිත අනුපාතය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) මෙම බැංකුවේ ගනුදෙනුකරුවෙකු තම ජංගම ගිණුමෙන් රුපියල් මිලියන 2 000ක් ආපසු ගනු ලැබේ යැයි සලකන්න. මෙම මුදල් ඉවත් කර ගැනීම නිසා, බැංකුවේ සංචිතය කොපමණ ප්‍රමාණයකින් වෙනස් වන්නේ ද? (ලකුණු 02යි)

(ඉ) අවශ්‍ය කරන සංචිත අනුපාතය නොවෙනස්ව පවතී නම්, රුපියල් මිලියන 2 000ක තැන්පතු ප්‍රමාණය ඉවත් කරගත් විට, මෙම බැංකුවට අලුතින් ලබා දිය හැකි උපරිම ණය ප්‍රමාණය කොපමණ වේ ද? (ලකුණු 02යි)

(iv) මූල්‍ය ප්‍රතිපත්තිය යන්නෙන් කවරක් අදහස් වේ ද? (ලකුණු 03යි)

(v) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ණය පාලන ක්‍රම අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

**7.** (i) පහත දැක්වෙන දෑ පෞද්ගලික භාණ්ඩ ද, පොදු භාණ්ඩ ද නැතහොත් පොදු සම්පත් ද යන්න නිශ්චය කරන්න.

(අ) සාගරයේ සිටින මත්ස්‍යයින්

(ආ) රූපවාහිනී විකාශන සංඥා

(ඉ) ජීවන රටාව හා කොලෙස්ටරෝල් මට්ටම පිළිබඳ කෙරෙන මූලික පර්යේෂණ

(ඊ) ස්වාධිකාර බලපත්‍රයක් (patent) හිමිකර ගත හැකි, කොලෙස්ටරෝල් මට්ටම පහළ හෙළීමේ ඖෂධයක් සඳහා සිදු කෙරෙන විශේෂ පර්යේෂණයක් (ලකුණු 04යි)



EXAMMOOD.LK

(ii) නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ ආණ්ඩුවේ මැදිහත්වීම ඔබ සාධාරණය කරනුයේ කෙසේ ද? (ලකුණු 04යි)

(iii) බදු අය කිරීමේ සිරස් සාධාරණත්වය සහ තිරස් සාධාරණත්වය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

(iv) අයවැය හිඟයන් වෙළෙඳපොළ පොලී අනුපාතිකය ඉහළ යාමටත්, පෞද්ගලික ආයෝජන පහළ යාමටත් දායක වන්නේ යැයි ඇතැම් ආර්ථික විද්‍යාඥයින් තර්ක කරනුයේ ඇයි? (ලකුණු 04යි)

(v) "කලාපයේ අන් රටවල් සමග සංසන්දනය කරන විට, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය තවමත් ඉහළ අගයක පවතී." රාජ්‍ය ණය, මැදි හා දිගු කාලීනව තිරසාර මට්ටමක පවත්වා ගැනීම සහතික කිරීම් වස්, රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04යි)

8. (i) A රට උරුම කරගත් ශ්‍රම සම්පත් ප්‍රමාණය ඒකක 200ක් ද, B රට උරුම කරගත් ශ්‍රම සම්පත් ප්‍රමාණය ඒකක 200ක් ද වේ යැයි සලකන්න. එක් එක් රටෙහි X සහ Y යන භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කරන ශ්‍රම ඒකක ප්‍රමාණ පහත සඳහන් වගුවේ දැක්වේ.

| A රට | | B රට | |
|---|---|---|---|
| භාණ්ඩය | ශ්‍රම ඒකක | භාණ්ඩය | ශ්‍රම ඒකක |
| X | 5 | X | 4 |
| Y | 4 | Y | 8 |

(අ) එක් එක් රට සඳහා නිෂ්පාදන හැකියා වක්‍ර වෙන් වෙන්ව ඇඳ, ඒවා නිවැරදිව නම් කරන්න. (ලකුණු 04යි)

(ආ) එක් එක් රටට කවර භාණ්ඩයක් සඳහා නිරපේක්ෂ වාසි තිබේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ඉ) එක් එක් රටට කවර භාණ්ඩයක් සඳහා සාපේක්ෂ වාසි තිබේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ii) සාපේක්ෂ වාසි බිහි කෙරෙන ඕනෑම මූලාශ්‍ර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iii) ගෙවුම් ශේෂ ලේඛනයක ජංගම ගිණුමෙහි ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 02යි)

(iv) නාමික විනිමය අනුපාතිකය සහ සඵල විනිමය අනුපාතිකය අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(v) නිදහස් වෙළෙඳාමට පක්ෂව ඉදිරිපත් කෙරෙන තර්ක මොනවා ද? (ලකුණු 04යි)

9. (i) 'ආර්ථික වෘද්ධිය' නිර්වචනය කොට, ආර්ථික වෘද්ධියේ ඉතා වැදගත් මූලාශ්‍ර සඳහන් කරන්න. (ලකුණු 05යි)

(ii) දිළිඳුකම තුරන් කිරීම සඳහා ආර්ථික වෘද්ධිය ප්‍රමාණවත් කොන්දේසියක් වේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) 'තිරසාර සංවර්ධනය' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05යි)

(iv) ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගිත්වය ඉහළ යාම, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වැදගත් වන්නේ ඇයි? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

10. (i) ගෝලීය වෙළෙඳපොළ තුළ, ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය ඉහළ නැංවීමෙහි ලා යෝග්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 05යි)

(ii) 2002 - 2016 කාලපරිච්ඡේදය තුළ, ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ සහ ආදායම් විෂමතාවයේ උපනති පරීක්ෂා කරන්න. (ලකුණු 05යි)

(iii) 1977 දී ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබූ ආර්ථික නිර්බාධිකරණ ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අංග වූයේ කවර ඒවා ද? (ලකුණු 05යි)

(iv) තිරසාර හා වේගවත් ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීමෙහි ලා ශ්‍රී ලංකාව විසින් ජය ගත යුතු ප්‍රධාන අභියෝග කවරේ ද? (ලකුණු 05යි)

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK